රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
அரசாங்க தகவல் திணைக்களம்
Department of Government Information

## 2024-05-06 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹුණු තීරණ

### 01. ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය ඩිජිටල් පරිවර්තනයට ලක් කිරීම

ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය ඩිජිටල් පරිවර්තනයට ලක් කිරීමට අදාළව ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති යෝජනාවක් අනුව ඒ සඳහා ආධාර ලබා දීමට චීන රජය විසින් එකඟතාව පළ කර ඇත. එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අදාළව ශක්‍යතා අධ්‍යයනයක් ද ඒ වන විට සිදු කරනු ලැබ තිබේ. යෝජිත ව්‍යාපෘතිය මඟින් පාසල් සඳහා සම්ප්‍රේෂණ සුහුරු පුවරු සහිත පන්ති කාමර (Delivering Class Room), ප්‍රතිග්‍රාහක සුහුරු පුවරු සහිත පන්ති කාමර (Receiving Class Room) සහ එම කටයුතු මෙහෙයවීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය තුළ ජාල මෙහෙයුම් ඒකකයක් (Data Center), චිත්‍රාගාරයක් (Studio Room), සම්මන්ත්‍රණ කාමරයක් (Conference Room) ලබා දීමට අපේක්ෂිතය. මිශ්‍ර ඉගෙනුම් ක්‍රමවේදය විධිමත්ව සිදු කිරීම, සම්පත් බෙදා ගැනීම, විශේෂ කුසලතා ඇති ගුරු භවතුන්ගේ දැනුම අවශ්‍ය අවස්ථාවන්හිදී සිසුන්ට ලබා දීම, ගුරු භවතුන් හිඟ අවස්ථාවන්හිදී ඇති වන ගැටලුකාරී තත්ත්ව මග හරවා ගැනීම හා යෝජිත අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සඳහා පහසුකම් සැලසීම යන කාර්යයන් ඵලදායිව හා කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා එකී උපාංග මඟින් සහාය ලබා ගැනීමට හැකි වනු ඇත. ඒ අනුව, අදාළ ශක්‍යතා අධ්‍යයන වාර්තාව මත පදනම්ව යෝජිත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම පිණිස අධ්‍යාපන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

### 02. ජාතික ගුරු සභාව පිහිටුවීම

අඛණ්ඩ වෘත්තීය සංවර්ධනයක් හරහා ගුරුවරුන්ගේ වෘත්තිමයභාවය සහ ගුණාත්මක බව ඉහළ නැංවීම සඳහා අනෙකුත් වෘත්තීය සේවා කාණ්ඩයන් සහ ජාත්‍යන්තර ප්‍රශස්ත භාවිතයන් හා සමගාමීව ජාතික ගුරු සභාවක් පිහිටුවීමට ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුව මඟින් යෝජනා කර ඇත. ඒ අනුව, අධ්‍යාපන ක්ෂේත්‍රයේ අදාළ පාර්ශ්වකරුවන් සමඟ දීර්ඝ වශයෙන් සාකච්ඡා කිරීමෙන් අනතුරුව සකස් කරනු ලැබ ඇති මූලික කෙටුම්පත මත පදනම්ව ජාතික ගුරු සභාවක් පිහිටුවීම සඳහා පනත් කෙටුම්පතක් සකස් කරන ලෙස නීති කෙටුම්පත් සම්පාදකට උපදෙස් දීම පිණිස ගරු ජනාධිපතිතුමා සහ අධ්‍යාපන අමාත්‍යතුමා ඉදිරිපත් කළ ඒකාබද්ධ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

163, කිරුළපන මාවත, කොළඹ 05, ශ්‍රී ලංකාව.
163, கிருலபன வெனியு, கொழும்பு 05, இலங்கை.
163, Kirulapona Avenue, Colombo 05, Sri Lanka.
දු. තො T - (+94 11) 2515759
ෆැ. பெ F - (+94 11) 2514753
ඊ மி E - dg@dgi.gov.lk
www.dgi.gov.lk
www.news.lk

## 03. වෛද්‍ය අධ්‍යාපනය සංශෝධනය කිරීම

ජාත්‍යන්තරව පිළිගත් විශ්වවිද්‍යාලයන්හි වෛද්‍ය උපාධි පාඨමාලා ශ්‍රී ලංකාව තුළ පිළිගැනීම සඳහා පදනම් කර ගත යුතු ප්‍රමිතීන් හා නිර්ණායක ඇතුළත් ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම සඳහා සහ වර්තමාන අවශ්‍යතාවන්ට ගැළපෙන පරිදි වෛද්‍ය අධ්‍යාපනයේ විධිවිධාන සංශෝධනය කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම පිණිස අග්‍රාමාත්‍ය ලේකම්ගේ ප්‍රධානත්වයෙන් පත් කරන ලද කමිටුව විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා 2023-10-09 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දෙන ලදී. ඒ අනුව, එකී නිර්දේශ මත පදනම්ව වෛද්‍ය අධ්‍යාපනය සංශෝධනය කිරීම සඳහා නීති කෙටුම්පත් සම්පාදක විසින් සකස් කරනු ලැබ ඇති පනත් කෙටුම්පතට නීතිපතිගේ නිෂ්කාශනය ලැබී තිබේ. එකී පනත් කෙටුම්පත රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීමටත්, ඉන් අනතුරුව අනුමැතිය පිණිස පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත් සෞඛ්‍ය අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 04. මන්නාරම සහ පූනරීන්හි මෙගාවොට් 484ක සුළං විදුලි බලාගාර සංවර්ධනය කිරීම

ඉන්දියාවේ M/s Adani Green Energy Limited විසින් මන්නාරම සහ පූනරීන්හි සුළං විදුලි බලාගාර සංවර්ධනය කිරීම සඳහා අවබෝධතා ගිවිසුමකට එළඹීම පිණිස 2022-03-07 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, එම සමාගම විසින් ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති යෝජනාව ඇගයීම පිණිස අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද සාකච්ඡා සම්මුති කමිටුවක් පත් කරනු ලැබ තිබේ. එකී කමිටුවේ නිර්දේශ මත පදනම්ව යෝජිත ව්‍යාපෘතිය යටතේ නිපදවන විදුලිය සඳහා කිලෝවොට් පැයකට ඇමෙරිකානු ඩොලර් ශත 8.26ක අගය (සැබෑ විනිමය අනුපාතය අනුව ශ්‍රී ලංකා රුපියල්වලින් ගෙවීමට යටත්ව) අවසන් ගාස්තුව වශයෙන් පිළිගැනීමටත්, වසර 20ක කාලසීමාවක් සඳහා M/s Adani Green Energy SL Limited වෙත විදුලිය මිල දී ගැනීමේ වෙන්ඩරය පිරිනැමීමටත් විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**********